# උඩපළාත ප්‍රාදේශීය සභාව
# 2022.07.19 දින ටෙන්ඩර් මණ්ඩල වාතර්ාව

කායර්ාලයීය කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යැම සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ කිහිපයක් මිලදී ගැනීමට මෙවරද ටෙන්ඩර් මණ්ඩලයක් පැවැත්වීමට කටයුතු කරන ලදි.

- **තීරණ අංක 01**

ගබඩාවට අවශ්‍ය කරන මුද්‍රිත ලේඛන මුද්‍රණය කරවා ගැනීම සඳහා මිල ගණන් කැඳවීය.

| අනු අං: | **විස්තරය** | |
|---|---|---|
| 01 | ප්‍රා.ස 03 ලේඛන | මිල ගණන් ලැබී නොතිබුණි. |
| 02 | වැය ලේඛන | |

මේ සඳහා මිල ගණන් ලැබී නොතිබුණි.නැවත මිල කැඳවීම සුදුසු බවට තීරණය විය. (ආයතන 03කින් මිල ගණන් කැඳවා තිබුණි)

- **තීරණ අංක 02**

වත්තහේන ජල යෝජනා ක්‍රමයට අවශ්‍ය ක්ලෝරිනේටරයක් මිලට ගැනීමට මිල ගණන් කැඳවීය.

| අනු අං: | **විස්තරය** | |
|---|---|---|
| 01 | ක්ලෝරිනේටරය | මිල ගණන් ලැබී නොතිබුණි. |

මේ සඳහා ද ආයතන 04කින් මිල ගණන් කැඳවූ නමුත් මිල ගණන් ලැබී නොතිබුණි. නැවත මිල කැඳවීමට හෝ ආයතනවලට ගොස් විමසා බැලීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

- **තීරණ අංක 03**

වත්තහේන ජල යෝජනා ක්‍රමය සම්බන්ධ නිල නිවස සහ ජල ටැංකි අලුත්වැඩියා කිරීමට අවශ්‍ය තීන්ත මිලදී ගැනීමට මිල ගණන් කැඳවීය.

| අ අං | විස්තරය | ජයලංකා හාඩ්වෙයාර් | MODERN HARDWARE |
|---|---|---|---|
| 01 | ඉමල්ෂන් තීන්ත (සුදු) 4L | 6760.00 (මල්ටිලැක්) | 7000.00 (මල්ටිලැක්) |
| 02 | ඉමල්ෂන් තීන්ත (වණර්) ලීටර් 4L | 7740.00 | 6550.00 |
| 03 | ඉමල්ෂන් තීන්ත වෙදෂරීල්ඩ් (Sky Blue) 4L | 10125.00 | 15500.00 |
| 04 | 4'' තීන්ත පින්සල් | 745.00 | 750.00 |
| 05 | 8'' තීන්ත රෝලර් | 950.00 (නිපොන්) | 850.00 |

ආයතන 04කින් මිල ගණන් කැඳවූවත් මිල ගණන් 02ක් පමණක් ලැබී තිබූ අතර මිල ගණන් පරීක්ෂා කිරීමේදී අයිතම එකක් පමණක් සභාවේ ලියාපදිංචි නොවන මොඩනර් හාඩ්වෙයාර් ආයතනයේ මිල අවම වන අතර

අනෙක් සියලු අයිතම මිල අවම නොවීම හේතුවෙන් අවම මිල ගනන් දක්වා ඇති සහ පරීක්ෂා කර බලා හෝ මාරු කිරීමට අවශ්‍ය වුවහොත් එයටද පහසු වීම නිසාත් ජයලංකා හාඩ්වෙයාර් ආයතනයෙන් ඉමල්ෂන් තීන්ත (සුදු) 4L 01ක් රු.6760.00 ට ත්, ඉමල්ෂන් තීන්ත ලීටර් 4L රු.7740.00 ටත්, ඉමල්ෂන් වෙදර්ශීල්ඩ් 4L 01ක් රු.10125.00 ටත්, 4'' තීන්ත පින්සල් 01ක් රු.745.00ටත්, 8'' තීන්ත රෝලර් 01ක් රු.950.00 ටත් මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. තවද, මුදල් ගෙවීමට භාණ්ඩ ලබා ගැනීමෙන් පසුව සිදු කළ හැකි අතර මොඩනර් හාඩ්වෙයාර් ආයතනය දන්වා සිටියේ භාණ්ඩ ලබා ගැනීමේදී මුදල් ගෙවා අවසන් කළ යුතු බවය. එබැවින් මෙම භාණ්ඩ ජයලංකා ආයතනයෙන් මිලට ගැනීම සුදුසු බව දන්වා සිටියේය.

- තීරණ අංක 04

නව බඳවාගැනීම් සිදු කළ මාගර් කම්කරුවන් හට අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මිල ගණන් කැඳවීය.

| අනු අං | විස්තරය | සී.කේ. හාඩ්වෙයාර් | ජය ලංකා හාඩ්වෙයාර් | ශ්‍යාමා හාඩ්වෙයාර් |
|---|---|---|---|---|
| 01 | උදළු තල(කිඹුලා) | 4050.00 | 3250.00 | 3900.00 |
| 02 | බූට් කට්ටල | 3500.00 | 1900.00 | 2750.00 |

ලද මිල ගණන් අනුව හොදම වගර්යේ (කිඹුලා) උදළු තලයක් අවම මිලට එනම් රු. 3250.00 ටත් ඩී.එස්.අයි. වගර්යේ බූට් කට්ටලයක අවම මිල රු. 1900.00 ටත් ජය ලංකා හාඩ්වෙයාර් ආයතනයෙන් මිලදී ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- තීරණ අංක 05

කායර්ාලයේ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින්ට අවශ්‍ය නිල ඇඳුම් සහ කායර්ාල බෑග් මිලට ගැනීමට මිල ගණන් කැඳවීය. ලියාපදිංචි සැපයුම්කරුවන් එක් අයෙක් පමණක් ඇති බැවින් ප්‍රදේශයේ ප්‍රසිද්ධ සැපයුම් ආයතන මගින් ද මිල ගණන් කැඳවීය.

| අනු අං | විස්තරය | බන්දුල ටේලසර් | නිව් සමනල | සී.අයි.බී. |
|---|---|---|---|---|
| 01 | කාකි අත් දිග සුදු කමිස | 3400.00 | 3525.00 | 3348.80 |
| 02 | කාකි දිග කලු කලිසම් | 3400.00 | 3525.00 | 3354.40 |
| 03 | සුදු සාරි | 3025.00 | 3175.00 | 2968.00 |
| 04 | සපත්තු කුට්ටමක් | 2950.00 | 3050.00 | 2900.00 |
| 05 | මේස් කුට්ටමක් | 300.00 | 375.00 | 280.00 |
| 06 | කාන්තා සපත්තු කුට්ටමක් | 2500.00 | 2550.00 | 2452.80 |
| 07 | කායර්ාල බෑග් (ලෙදර්) පිරිමි<br>කාන්තා | 2850.00<br>2850.00 | 2925.00<br>2925.00 | 2716.00<br>2716.00 |

සභාවේ සැපයුම් ආයතනය වන ලිතුවේදාස් ආයතනයෙන් මිල ගණන් ලැබී නොතිබූ අතර මිල ගණන් ලැබී තිබුණේ ආයතන තුනකින් පමණි. එම මිල ගණන් අනුව අවම මිල ගණන් යටතේ සහ ප්‍රදේශයේ ප්‍රසිද්ධ

සැපයුම්කරුවෙකු වන ස.අයි.බී.ආයතනයෙන් ක්ෂේත්‍ර නිලධාරීන්ට අවශ්‍ය නිල ඇඳුම් මිලදී ගැනීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩල තීරණය විය. ඒ අනුව කාකි අත් දිග කමිස 1 ක් රු.3348.80ටත් ,කාකි කලු කලිසම් 1 ක් රු.3354.40 ටත් , සුදු සාරි 1 ක් රු.2968.00 ටත් , සපත්තු කුට්ටමක් 2900. 00 ටත්, මේස් කුට්ටමක් රු. 280.00 ටත් , කාන්තා සපත්තු කුට්ටමක් රු. 2452.80 ටත් , කායර්ාල බෑග් 1 ත් 2716.00 ටත් මිලට ගැනීම සුදුසු බවට ටෙන්ඩර් මණ්ඩල තීරණය විය.

**තීරණ අංක 06**

සභාවට අයත් WP PF-7352 කැබ් රථය අලුත්වැඩියා කටයුතු(එන්ජිම) සිදු කිරීම සඳහා මිල ගණන් කැඳවන ලදි. ඒ සඳහා ලද මිල ගණන් පහත පරිදි වේ. (සභාවේ ලියාපදිංචි සහ පළාත් ලියාපදිංචිකරුවන්)

| අනු අං | විස්තරය | නිව් මීවතුර මෝටසර් | පොල්ගොල්ල ඔටෝ මොබයිල් | සදසිරි මෝටසර් | සදසිරි මෝටසර් | මාතලේ මෝටසර් |
|---|---|---|---|---|---|---|
| 01 | කැබ් රථයේ එන්ජිම අලුත්වැඩියා කිරීම (යාන්ත්‍රික දෝෂයකි) (Engine Repair) | රු. 429,620.00 දින 14ක් වලංගුය.වෙනත් අමතර කොටස් වෙනම වෙනම මුදල් අය කෙරේ. | රු. 919,550.00 | රු. 825,500.00 වසරක වගකීම. දින 20 කි. (ටයිමින් බෙල්ට සහිත) | රු. 683,950.00 වගකීම නැත. දින 20කි. (ටයිමින් බෙල්ට රහිත) | මෙම ආයතනය වෙත කැබ් රථය ගෙන ගොස් පරීක්ෂා කරවා බලා මිල ගණන් ගත යුතුය. |

මේ සඳහා ලද මිල ගණන් අනුව මාතලේ මෝටසර් දක්වා ඇත්තේ අදාල කැබ් රථය ඔවුන් වෙත ගෙනවිත් දුන්නොත් මිල ගණන් ලබාදිය හැකි බවයි.තවද සඳසිරි මෝටර් ආයතනය ටයිමින් බෙල්ට් රහිතව හා සහිතව මිල ගණන් ලබා දී ඇති අතර අවම මිල ලබා දී ඇත්තේ මීවතුර මෝටසර් ආයතනයෙනි.එම ආයතනයේ මිල ගණන් පරීක්ෂා කිරීමේදී ජපන් අමතර කොටස් යෙදීම සිදුකරන අතර එන්ජිම ගලවා බලා පරීක්ෂා කර අවශ්‍ය වුවහොත් අමතර කොටස් සඳහා තව දුරටත් මුදලක් වැය වන බව දක්වා ඇති බැවින්,ප්‍රථමයෙන්ම මෙම මිල ගණන් සම්බන්ධව ඉංජිනේරුතුමියගෙන් වාතර්ාවක් ලබා ගෙන පසුව නිව් මීවතුර ආයතනයේ මිල ගණන අවම වීම නිසා එම ආයතනයේ කැබ් රථය අලුත්වැඩියා කිරීමට යෝජනා වුවහොත් නිශ්චිතවම කැබ් රථ අලුත්වැඩියාව සඳහා වැය වන මුදල පිළිබඳ නිව් මීවතුර මෝටසර් ආයතනය සමඟ යම් එකඟතාවයකට පැමිණීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලයේදී යෝජනා විය.එහිදී සඳහන් කොට ඇති රු.429620.00ට අමතරව 20% ක් දක්වා පමණක් මුදල් වඩිපුර වැය කළ හැකි බවටද නිව් මීවතුර මෝටසර් ආයතනය දැනුවත් කළ යුතු බවටද ටෙන්ඩර් මණ්ඩලය තීරණය විය.

<u>ටෙන්ඩර් මණ්ඩලය</u>

01. ඩී.ජී. ගුණසේන මයා - ගරු සභාපති
02. අසේල අමරසේන මයා - ගරු උප සභාපති
03. ජයන්ත කීතර්සිංහ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. ශාන්ත නවරත්න මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. ඒ.එච්.ඒ.රත්නායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. හේමකුමාර නයනානන්ද මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. මංජුල දිසානායක මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. රන්ජන් රාජපක්ෂ මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

09. තංගවේලු කාමරාජන් මයා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩිමෝෂි වෙලපලාගම මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි
11. කෝකිලා වරාහේන මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි

එස්.සුබසිංහ මිය - ලේකම්
ඩබ්.එන්.පොඩිමැණිකේ මිය - සංවධර්න නිලධාරි

සකස් කළේ: ...……………......…………

පරීක්ෂා කළේ: ………………………….....

සභාපති / ලේකම්: ……………...................…